# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2177/5 - 2020 මැයි මස 26 වැනි අඟහරුවාදා - 2020.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

46 වන වගන්තියෙහි 1 වන උපවගන්තිය යටතේ නිකුත් කෙරෙන නියෝගය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලබල (සංශෝධිත) පනතේ 46 වන වගන්තියේ 1 වන උපවගන්තිය යටතේ පැවරෙන බලතල අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ II තීරුවේ දක්වා ඇති ආකාරයට එම උපලේඛනයේ I තීරුවේ සඳහන් පරිදි අදාළ බලපත්‍ර හිමි බලපත්‍රලාභීන්ගෙන් අයකර ගනු ලැබීම පිණිස වාර්ෂික බද්දක් පනවනු ලබයි. මෙයට පෙර පළකරන ලද 2019 අප්‍රේල් 29 වැනි දින අංක 2121/18 දරන ගැසට් නිවේදනය මෙයින් අවලංගු කෙරේ.

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

2020 මැයි මස 19 වැනි දින,
6 වන මහළ,
ලංකා බැංකු වෙළෙඳ කුළුණ,
අංක 28, සාන්ත මයිකල් පාර,
කොළඹ 03.

**උපලේඛනය**

| *I තීරුව*<br>*බලපත්‍රය* | *II තීරුව*<br>*වාර්ෂික බද්ද* |
|---|---|
| ජනන බලපත්‍රය<br>සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති<br>සාම්ප්‍රදයික නොවන පුනර්ජනනීය බලශක්ති නොවන වෙනත් ජනන තාක්ෂණ | සත්‍ය ස්ථාපිත ධාරිතාවය මෙගා වොට් 1ට රුපියල් 14,900.00<br>ස්ථාපිත ධාරිතාවය මෙගා වොට් 1ට හෝ ඉන් කොටසකට රුපියල් 14,900.00 |
| සම්ප්‍රේෂණ බලපත්‍ර | පෙර වසරේ කාර්ය බහුල ඉල්ලුම මෙගා වොට් 1ට හෝ ඉන් කොටසකට රුපියල් 9,200.00 බැගින් |
| බෙදාහැරීම් බලපත්‍ර | පෙර වසරේ මීනුම්ගත බලශක්තිය ගිගා වොට් පැය 1ට හෝ ඉන් කොටසකට රුපියල් 7,400.00 බැගින් |

1A - PG 4984 — 18 (2020/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී. ජ

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*